# බුත්සරණින් නිරූපිත දොළොස්වන, දහතුන්වන සියවස්හි සිංහල භාෂාවේ ස්වරූපය

නිල්මිණි දයානන්ද


## Abstract

*Buthsaranais considered incomparable Sinhalese prose. It was written by Vidyachakravarthi at the end of 12th century or at the beginning of 13th century A.D. Buthsarana reflects a fully developed stage of Sinhalese Language.*

*Many grammatical features and varieties of* ***nouns*** *and* ***verbs*** *which are used in the Sinhalese Language today can be seen inButhsarana. Many* ***prepositions*** *which are used at present are included in Buthsarana. Prepositions with one meaning as well as with different meanings can be seen. Many Prepositions in Buthsaranaare used to give similar meanings even today however some prepositions are used in different meanings. In addition,some prepositions in Buthsaranaare absolete at present. It has been found that some prepositions and meanings of prepositions which were used in 12th and 13th centuries are demonetized in the ongoing period of time.*

*The* ***arrangement of the subjectand the predicate*** *and* ***sentence patterns*** *included in Buthsarana are similar to that of the present. As a whole, it is clear that majority of the language features have been established in Sinhala language at the time whenButhsaranawas written.*


**Key words:** Buthsarana, Mideival language, Grammer

**Author Details:** කථිකාචාර්ය, මානව ශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

**Citation**: දයානන්ද, නිල්මිණි, (2013), බුත්සරණින් නිරූපිත දොළොස්වන, දහතුන්වන සියවස්හි සිංහල භාෂාවේ ස්වරූපය, The Journal of Archaeology and Heritage Studies, 1(2)

### හැඳින්වීම

මෙය ඓතිහාසික වාග්විද්‍යා විෂය ක්ෂේත්‍රයට අයත්, බුත්සරණේ වාක්‍ය විචාරාත්මක අධ්‍යයනයක් පදනම් කරගත් පර්යේෂණාත්මක ලිපියකි. මෙහි දී බුත්සරණේ අන්තර්ගත නාම, ක්‍රියා, නිපාත, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය කෙරෙහි බලපාන ව්‍යාකරණ රීති හා වාක්‍යාර්ථ ප්‍රභේද කෙරෙහි අවධානය යොමු කර ඒ ඇසුරින් දොළොස්වන, දහතුන්වන සියවස්හි සිංහල භාෂාවේ ස්වරූපය පැහැදිලි කිරීමට උත්සහ දරනු ලැබේ.

### ක්‍රමවේදය

මෙය සාම්ප්‍රදායික සිංහල ව්‍යාකරණ වේදීන්ගේ සහ නූතන වාග්වේදීන්ගේ මූලධර්මවල සංකලනයෙන් සිදු කරන ලද විශ්ලේෂණයකි. බුත්සරණ වැනි සම්භාව්‍ය සිංහල ගද්‍ය ග්‍රන්ථයක වාක්‍ය විචාරාත්මක ලක්ෂණ හැදෑරීමට සුදුසු ම සැලැස්ම වන්නේ එයයි. මෙම පර්යේෂණය සඳහා බුත්සරණේ ලබුගම ලඞ්කානන්ද සංස්කරණය භාවිත කොට ඇති අතර එහි උධෘත ඉදිරියෙන් අදාළ පිටු අංක යොදා ඇත.

**බුත්සරණින් නිරූපිත දොළොස්වන, දහතුන්වන සියවස්හි සිංහල භාෂාවේ ස්වරූපය**

දොළොස් වන ශතවර්ෂයේ අග භාගයේ දී හෝ දහතුන් වන ශතවර්ෂයේ මුල් භාගයේ දී හෝ විද්‍යාචක්‍රවර්තීන් විසින් රචනා කරන ලද බුත්සරණ, සම්භාව්‍ය සිංහල ගද්‍ය සාහිත්‍යයේ මුදුන් මල්කඩ වශයෙන් සැලකේ (සන්නස්ගල 1961:143). ඊට ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ බුත්සරණ පුරා විචිත්‍ර රචනා රීතියක් විද්‍යමාන වීම ය. එහි ලක්ෂණ වන්නේ සවිස්තරාත්මකභාවය, පුනරුක්තිය සහ අතිශයෝක්තියයි. ගද්‍යයෙන් රචනා වී ඇතත්, වෘත්තයකට අයත් ලක්ෂණය එහි ඇත. බුත්සරණෙහි ඇතැම් තැනක සාමාන්‍යයෙන් පද්‍ය පිළිබඳ සැලකෙන වෘත්තය ද දක්නට ලැබේ. කෙටි වාක්‍ය ඛණ්ඩ කිහිපයක් එක් ව සැකසී ඇති දීර්ඝ වාක්‍ය ද මේ ගද්‍ය රීතියේ විශේෂ ලක්ෂණයකි. මෙම විචිත්‍ර රචනා රීතිය හේතුවෙන් බුත්සරණ ගද්‍ය කාව්‍ය ස්වරූපයක් උසුලයි (කුලසූරිය 1999:192).

බුත්සරණ තුළින් පිළිබිඹු වන්නේ සිංහල ගද්‍යයේ දියුණු වකවානුවකි. මේ වන විට සිංහල භාෂාව ඊට ආවේණික ලක්ෂණ සහිත ව ප්‍රවර්ධනය වී තිබිණ.

**නාම පද**

නාම පද යනු කිසියම් ප්‍රාණියකු හෝ ස්ථානයක් හෝ ද්‍රව්‍යයක් හෝ හැඳින්වීම සඳහා යොදනු ලබන පද විශේෂයකි (Gunasekara 1962:52). බුත්සරණේ ඇතුළත් නාම පදවල ප්‍රාණවාචී-අප්‍රාණවාචී භේදය, පුරුෂ භේදය, වචන භේදය, ලිංග භේදය, නියත-අනියත භේදය හා විභක්ති භේදය යන ව්‍යාකරණ ලක්ෂණ දක්නට ලැබේ.

නාම පද 'ප්‍රාණවාචී නාම පද' හා 'අප්‍රාණවාචී නාම පද' යනුවෙන් දෙ වැදෑරුම් වේ. ප්‍රාණීන් හැඳින්වීම සඳහා යෙදෙන නාම පද 'ප්‍රාණවාචී නාම පද' යනුවෙන් හැඳින් වේ. "ශක්‍රයා"(3), "චන්ද්‍රාදේවී" (13) හා "කිඹුලා" (157) ආදිය මේ පිළිබඳ නිදසුන් ය.

වචන භේදය අනුව 'ඒකවචන නාම පද' හා 'බහුවචන නාම පද' යනුවෙන් නාම පද දෙ වැදෑරුම් වේ. සංඛ්‍යා භේදයට ව්‍යාකරණමය වශයෙන් වැදගත්කමක් ලැබෙනුයේ පදාන්තර සම්බන්ධය හා වාක්‍ය සංවිධානය ආදිය කෙරෙහි ඉන් ඇති වන බලපෑම හේතුවෙනි.

'ඒකවචන නාම පද' යනු එක් ප්‍රාණියකු හෝ එක් දෙයක් හෝ හැඳින්වීම සඳහා භාවිත වන නාම පදයි. ඒකවචන නාම පදවලින් ප්‍රකාශිත අර්ථ අනුව ඒවා 'ඒකාර්ථ ඒකවචන නාම පද' හා 'සමූහාර්ථ ඒකවචන නාම පද' යනුවෙන් දෙයාකාර ය. අර්ථ වශයෙන් එකක් හෝ එක් කෙනෙකු හෝ හඟවන නාම පද 'ඒකාර්ථ ඒකවචන නාම පද' ලෙස ද, අර්ථ වශයෙන් එකකට හෝ එක් කෙනෙකුට වැඩි සංඛ්‍යාවක් හඟවන ඒකවචන නාම පද 'සමූහාර්ථ ඒකවචන නාම පද' ලෙස ද හැඳින් වේ (දිසානායක 2000:29). "බමුණා" (3), "සුජාතාව" (11) ආදිය ඒකාර්ථ ඒකවචන නාම පද සඳහා ද, "පිරිස" (4), "සෙනඟ" (63) ආදිය සමූහාර්ථ ඒකවචන නාම පද සඳහා ද නිදසුන් ය.

එක් ප්‍රාණියකුට හෝ එක් දෙයකට හෝ වැඩි සංඛ්‍යාවක් දැක්වීම සඳහා භාවිත වන නාම පද බහුවචන නාම පද යනුවෙන් හැඳින් වේ. "දේවතාවෝ" (57), "මිනිස්සු" (194) ආදී පද මීට නිදසුන් වේ.

උදා:"දෙවතාවෝ මිනිසුන් දකිති. මිනිස්සු දෙවතාවන් දකිති." (116)

එහෙත් ඇතැම් විට ඒකවචන නාම පදවලට 'ඕ', 'හු' ප්‍රත්‍ය එකතු වූ විට ඒවා බහුවචන නාම පද ලෙස සැලකේ. එ බඳු බහුවචන නාම පද හැඳින් වෙනුයේ 'ගෞරවාර්ථ බහුවචන නාම පද' යනුවෙනි.

ගෞරවාර්ථ බහුවචන නාම පද දෙ වැදෑරුම් වේ. එ නම් 'ප්‍රාකෘතික ගෞරවාර්ථ බහුවචන නාම පද' හා 'තද්ධිතවත් ගෞරවාර්ථ බහුවචන නාම පද' යනුවෙනි. 'ප්‍රාකෘතික ගෞරවාර්ථ බහුවචන නාම පද' යනු බහුරූප ප්‍රත්‍යයට පූර්වයෙන් නාම ප්‍රකෘතියක් පමණක් යෙදී සෑදුණු ගෞරවාර්ථ බහුවචන නාම පදයි. නාම ප්‍රකෘතියට අමතර ව තද්ධිත පදාංශුවක් ද සහිත බහුවචන නාම පද විශේෂය හැඳින්වෙනුයේ 'තද්ධිතවත් ගෞරවාර්ථ බහුවචන නාම පද' යනුවෙනි. මෙම ගණයට අයත් බහුවචන නාම පද සාදාගැනීම සඳහා 'අණි', 'අණු', 'ආණ' යන තද්ධිත පදාංශු යොදාගනු ලැබේ (දිසානායක 2000:33,35). "සවාමිදරුවෝ" (66), "දෙව්දත්හු" (2) ආදී පද ප්‍රාකෘතික ගෞරවාර්ථ බහුවචන නාම පද සඳහා ද, "පියාණ" (3), "මෑණියෝ"(14) ආදී පද තද්ධිතවත් ගෞරවාර්ථ බහුවචන නාම පද සඳහා ද නිදසුන් වේ.

'අප්‍රාණවාචී නාම පද' යනු අජීවී වස්තූන් හැඳින්වීම සඳහා භාවිත වන නාම පදයි. "දර" (63),"කළය" (105) හා "පහන" (157) ආදිය මීට නිදසුන් වේ. ඇතැම් විට අප්‍රාණවාචී නාම පදවලට 'ඕ' ප්‍රත්‍ය යෙදීමෙන් ප්‍රාණත්වාරෝපණය කරනු ලැබේ. "චෛතසිකයෝ" (26),"ධම්යෝ" (27) හා "පර්වතයෝ" (46) ආදිය මේ පිළිබඳ නිදසුන් ය.

නාම පද 'උත්තම පුරුෂ', 'මධ්‍යම පුරුෂ' හා 'ප්‍රථම පුරුෂ' යන පුරුෂත්‍රයෙහි වරනැගේ. පුරුෂත්‍රයට අදාළ සර්ව නාම වෙන් වශයෙන් ඇති හෙයින් පුරුෂ භේදය පැහැදිලි ව දක්නට ලැබෙන්නේ සර්ව නාම සම්බන්ධයෙනි.

නාම පද 'ස්ත්‍රී ලිංග නාමපද' හා 'පුරුෂ ලිංගනාම පද' යනුවෙන් දෙයාකාර වේ." දෙවතාවා"(57), "වඳුරා"(2) හා "කුමාරයා"(82)ආදියපුරුෂ ලිංග නාමපද සඳහා ද, "උපාසිකා"(106), "සුරභිධෙනු" (279) හා "අඹු" (337) ආදිය ස්ත්‍රී ලිංග නාම පද සඳහා ද නිදසුන් වේ.

ඇතැම් විට තත්සම ස්ත්‍රී ලිංග පද සිංහල පද බවට පත් කිරීම සඳහා ස්ත්‍රීවාචී 'ව' ප්‍රත්‍යය ද එකතු වී ඇත."මානවිකාව" (23) හා "සජීධෙනුව" (131) වැනි පද මීට නිදසුන් ය.

නියත අනියත භේදය යනු කිසියම් නාම පදයකින් දැක්වෙන ප්‍රාණියාගේ හෝ වස්තුවේ හෝ නිශ්චිත අනිශ්චිත බව සඳහන් කිරීම සඳහා භාවිත වන ව්‍යාකරණමය ලක්ෂණයකි. සිංහල නාම පදවල මෙය රූපීය ලක්ෂණයක් වශයෙන් දක්නට ලැබෙනුයේ ඒකවචනයෙහි පමණි. අනියත රූපයෙහි මෙම වෙනස පැහැදිලි ව දැකිය හැකි ය.

යම් ප්‍රාණියකු හෝ වස්තුවක් හෝ නිශ්චිත වශයෙන් දැක්වීම සඳහා යොදනු ලබන නාම පද 'නියත නාම පද' යනුවෙන් හැඳින් වේ. මෙම නාම පදවල ධාතු ප්‍රකෘතියට පරව 'අ' සහ 'ආ' ප්‍රත්‍ය යෙදී තිබේ. "බැමිණිය" (62), "නා රජ" (90), "මිනිසා" (135) ආදී පද මේ පිළිබඳ නිදසුන් ය.

නිශ්චිත වශයෙන් දැක් විය නොහැකි ප්‍රාණියකු හෝ වස්තුවක් හෝ පිළිබඳ ව සඳහන් කිරීම සඳහා භාවිත වන නාම පද 'අනියත නාම පද' යනුවෙන් හැඳින් වේ.

මෙම නාම පද සකසාගනු ලබන්නේ ධාතු ප්‍රකෘතියට පර ව විවිධ ප්‍රත්‍ය යෙදීමෙනි. මෙහි දී පුරුෂ ලිංග උක්ත නාම පද සඳහා 'එක්'ප්‍රත්‍යය ද, පුරුෂ ලිංග අනුක්ත නාම පද සඳහා 'අකු' ප්‍රත්‍යයද, ස්ත්‍රී ලිංග උක්ත නාම පද සඳහා 'අක්' ප්‍රත්‍යය ද, ස්ත්‍රී ලිංග අනුක්ත නාම පද සඳහා 'අක' ප්‍රත්‍යය ද, අප්‍රාණවාචී උක්ත නාම පද සඳහා 'එක්' ප්‍රත්‍යය ද, අනුක්ත නාම පද සඳහා 'අක්' ප්‍රත්‍යය ද යොදනු ලැබේ. අනියත ප්‍රාණවාචී පුරුෂ ලිංග උක්තනාම පද ලෙස "බමුණෙක්" (34), "දෙවියෙක්" (34) ආදිය ද, අනියත ප්‍රාණවාචී පුරුෂ ලිංග අනුක්තනාම පද ලෙෂ "මහල්ලකු" (35), "කුමාරයකු" (143) ආදිය ද, අනියත ප්‍රාණවාචී ස්ත්‍රීලිංග උක්තනාම පද ලෙෂ "දුවක්" (218) යන්න ද, අනියත ප්‍රාණවාචී ස්ත්‍රීලිංග අනුක්ත නාම පද ලෙෂ "ඇතින්නක" (294), "කෙල්ලක" (337) ආදිය ද, අනියත අප්‍රාණවාචී උක්ත නාම පද ලෙෂ "ගසෙක්" (45), "නුගයෙක්" (49) ආදිය ද, අනියත අප්‍රාණවාචී අනුක්ත නාම පද ලෙස "මුහුදක්" (4), යෂ්ටියක්" (74)ආදිය ද දැක්විය හැකි ය.

තව ද නාම පද සංස්ථිතික වශයෙන් 'සරල නාම', 'සංකීර්ණ නාම' හා 'සමාස නාම' යනුවෙන් ද, ප්‍රයෝගාර්ථ වශයෙන් නාම නාම, සර්ව නාම, සංඛ්‍යා නාම, කෘදන්ත නාම හා සමාස නාම යනුවෙන් ද වර්ගීකරණය කොට දැක් විය හැකි ය.

නාම පද සංස්ථිතික වශයෙන් වර්ගීකරණය කෙරෙනුයේ ඒවා සකස් වී ඇති ආකාරය පදනම් කොටගෙන ය. මේ අනුව සිංහලයෙහි නාම පද සරල නාම, සංකීර්ණ නාම හා සමාස නාම යනුවෙන් තෙයාකාර වේ (කරුණාතිලක, 2003:50).

සරල නාම යනු හුදෙක් තනි නාම ප්‍රකෘතියකින් පමණක් සමන්විත වන නාම පදයි. "මිනිස්" (1), "ප්‍රේත" (1) හා "ඇත්" (5) ආදී පද සරල නාම ලෙස දැක්විය හැකි ය.

සංකීර්ණ නාම යනු ප්‍රකෘති ප්‍රත්‍ය එකතු වීමෙන් සෑදෙන නාම පදයි (කරුණාතිලක 2003:50). "බෝසතාණෝ" (14), "පුතක්හු" (18) යන පද මේ පිළිබඳ නිදසුන් වේ. බෝසත්, ආණ, ඕ යන පද එක්වීමෙන් "බෝසතාණෝ" යන පදය ද, පුත්, අක්, හු යන පද එක්වීමෙන් "පුතක්හු" යන පදය ද සැකසී ඇත.

නාම පදයක් මුල්කොටගත් පද කිහිපයක් තනි සංස්ථිතියක් වශයෙන් (කැටි කොට) දැක්වීම සමාස නම් වේ. සිංහල භාෂාවේ සමාස ප්‍රභේද පහක් දක්නට ලැබේ. එ නම් 'දකාරාර්ථ සමාසය', 'අව්‍ය සමාසය', 'විශේෂණ සමාසය', 'අන්‍යාර්ථ සමාසය' හා 'විභක්ති සමාසය'යි.

සමුච්චයාර්ථයක් ප්‍රකාශ කරන 'ද', 'යි', 'ත්' නිපාතයන්ගෙන් සම්බන්ධ කළ හැකි නාම පද කිහිපයක් එම නිපාත නොයෙදීමෙන් සෑදෙන සමාසය දකාරාර්ථ සමාසයයි. " මවුපියෝ" (18), "පරසතුමදාරා" (143) ආදී පද දකාරාර්ථ සමාස පද ලෙස දැක්විය හැකි ය.

නිපාත, උපසර්ග වැනි අව්‍ය පදයක් වෙනත් නාම පදයක් හා ගැළපීමෙන් සිදුවන සමාසය අව්‍ය සමාසයයි."නුගුණ" (219), "අභිධම්ය" (226) ආදිය අව්‍ය සමාස පද වේ.

යම්කිසි විශේෂණ පදයක් විශේෂ්‍ය පදයක් සමඟ ගළපා තනි පදයක් සේ සකසා ගැනීම විශේෂණ සමාසයයි. "රාජහංසයකු" (147), " නිල්මිණි" (208) ආදී පද මේ පිළිබඳ නිදසුන් ය.

සංඛ්‍යා නාම පදයක් විශේෂණයක් වශයෙන් යෙදී අනෙක් පදය හා ගැළපීම සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසයි. "තුන්පිටකය" (148), " සතරවරම්" (181) වැනි පද මීට නිදසුන් වේ.

සමාස වන පදවල අර්ථයට වඩා වෙනස් අරුතක් සමාස වූ පසු ප්‍රකාශ කරන්නේ නම් එය අන්‍යාර්ථ සමාසයයි. "තිලෝගුරු" (24), "නැගෙනහිර" (54) ආදිය අන්‍යාර්ථ සමාස පද ලෙස දැක්විය හැකි ය.

විභක්ති අර්ථයක් ගෙන දෙන පදයක් වෙනත් පදයක මුලින් යෙදීමෙන් සෑදෙන සමාසය විභක්ති සමාසයයි. මෙම සමාසයෙහි ප්‍රථම, ආලපන විභක්ති හැර සෙසු විභක්ති හත ම යෙදේ."මාලාකාර" (243) යන්න කර්ම විභක්ති සමාස පදයකි. "මල්දම්" (188) යන්න කරණ විභක්ති සමාස පදයකි. "ඇත්දළ" (16), "බුදුරුව" (31), "මිනීමස් " (64) ආදිය සම්බන්ධ විභක්ති සමාස පද වේ.

මේ ප්‍රයෝගාර්ථ වශයෙන් ද නාම පදවල ප්‍රභේද කිහිපයක් දක්නට ලැබේ. එ නම් නාම නාම, සර්ව නාම, සංඛ්‍යා නාම, කෘදන්ත නාම හා සමාස නාම ආදී වශයෙනි (කරුණාතිලක 2003: 51). මේ අතුරින් සමාස නාම පිළිබඳ ව ඉහත සඳහන් කරන ලද බැවින් මෙහි දී අවධානය යොමු කරනු ලබන්නේ සෙසු නාම ප්‍රභේද පිළිබඳ ව ය.

ප්‍රාණීන්, ස්ථාන හා වස්තු ආදිය හඳුන්වන නාම හැඳින් වෙනුයේ නාම නාම යනුවෙනි. මෙහි දී නාම නාමවල ජාති නාම, ද්‍රව්‍ය නාම, ගුණ නාම, භාව නාම හා සංඥා නාම යන ප්‍රභේද දක්නට ලැබේ (කරුණාතිලක 2003:51).

කිසියම් සමූහයකින් යම්කිසි කොටසක් වෙන් කර හඳුන්වා දීමට යොදනු ලබන නාම පද 'ජාති නාම' යනුවෙන් හැඳින් වේ. "දෙමළු" (4), "දෙවතාවා" (57) ආදිය ජාති නාම ලෙස දැක්විය හැකි ය.

'ද්‍රව්‍ය නාම' යනු අජීවී වස්තූන් හැඳින්වීම සඳහා යොදනු ලබන නාම පදයි. "දිය" (5), " පහන" (157), "පෙට්ටිය" (350) වැනි පද මීට නිදසුන් වේ.

යම් පුද්ගලයකුගේ හෝ යම් දෙයක පවතින විශේෂ ලක්ෂණයක් දැක්වීම සඳහා භාවිත වන නාම පද 'ගුණ නාම' යනුවෙන් හැඳින් වේ. "මිහිරි" (5), "සුවඳ" (6), "නපුරු" (7) ආදිය ගුණ නාම පදයි.

භාව නාම යනු ක්‍රියා ප්‍රකෘතියක් සහිත නාම පදයි. "ඉපැදීම්" (33), "සිතිවිල්ල" (128) හා " මැරීම" (263) ආදිය භාව නාම ලෙස දැක්විය හැකි ය.

කිසියම් ප්‍රාණියකු හෝ ස්ථානයක් හෝ වස්තුවක් හෝ වෙන් කොට හඳුනා ගැනීම සඳහා යොදනු ලබන නාම පද සංඥා නාමයනුවෙන් හැඳින් වේ. "නාලාගිරි" (2), " යසෝදරා" (3), "සැරියුත්" (7) වැනි පද මීට නිදසුන් වේ.

'සර්ව නාම' යනු නාම පදයක් වෙනුවට යෙදිය හැකි නාම පදයි. සර්ව නාමයන්නෙහි වාච්‍යාර්ථය 'සියල්ලටම ව්‍යවහාර වන නාම' යන්නයි (පෙරේරා 1985:124). සර්ව නාම පදවලද ප්‍රාණ භේදය, වචන භේදය, පුරුෂ භේදය, උක්ත අනුක්ත භේදය හා ලිංග භේදය දක්නට ලැබේ. "මම" (14), "මම්" (148) ආදිය උත්තම පුරුෂ ඒකවචන උක්තසර්ව නාම ලෙස ද, "මා" (5) යන්න උත්තම පුරුෂ ඒකවචන අනුක්ත සර්ව නාමයක් ලෙස ද, " අපි" (70), "ඇපි" (92) ආදිය උත්තම පුරුෂ බහුවචන උක්ත සර්ව නාම ලෙස ද, "අප" (11) යන්න උත්තම පුරුෂ බහුවචන අනුක්ත සර්ව නාමයක් ලෙස ද, "තො" (223) යන්න මධ්‍යම පුරුෂ (පුරුෂවාචී) ඒකවචන උක්ත සර්ව නාමයක් ලෙස ද, "නුඹ" (91), "ඔබ" (195) ආදිය මධ්‍යම පුරුෂ (පුරුෂවාචී) ඒකවචන අනුක්ත සර්ව නාම ලෙස ද, "තී" (223) යන්න මධ්‍යම පුරුෂ (ස්ත්‍රීවාචී) ඒකවචන උක්ත සර්ව නාමයක් ලෙස ද, "තොපි" (101), "තෙපි" (195) ආදිය මධ්‍යම පුරුෂ බහුවචන උක්තසර්ව නාම ලෙස ද, "තොප" (13) යන්න මධ්‍යම පුරුෂ බහුවචන අනුක්තසර්ව නාමයක් ලෙස ද, "හෙතෙමේ" (62), "හෙ" (320) ආදිය

ප්‍රථම පුරුෂ (පුරුෂවාචී) ඒකවචන උක්තසර්ව නාම ලෙස ද, "ඔහු" (14), "මොහු" (62) ආදිය ප්‍රථම පුරුෂ (පුරුෂවාචී) ඒකවචන අනුක්ත සර්ව නාම ලෙස ද, "මෝ තොමෝ"(13), "ඕ" (221) ආදිය ප්‍රථම පුරුෂ (ස්ත්‍රීවාචී) ඒකවචන උක්ත සර්ව නාම ලෙස ද, "ඈ" (219) යන්න ප්‍රථම පුරුෂ (ස්ත්‍රීවාචී) අනුක්ත සර්ව නාමයක් ලෙස ද, තුමූ" (168), "තුමු" (325) ආදිය ප්‍රථම පුරුෂ බහුවචන උක්තසර්ව නාම ලෙස ද, " ඔවුන්"(23), "මොවුන්"(104), "උන්" (127) ආදිය ප්‍රථම පුරුෂ බහුවචන අනුක්ත සර්ව නාම ලෙස ද බුත්සරණෙහි යෙදී ඇත.

සංඛ්‍යා නාම යනු ගණනය කිරීම් සඳහා අවශ්‍ය වන ඉලක්කම් වාචක නාම පදයි. සංඛ්‍යා නාමවල ද නියත-අනියත භේදය දක්නට ලැබේ. බුත්සරණෙහි බෙහෙවින් දක්නට ලැබෙන්නේ අනියත සංඛ්‍යා නාමයි. "අසූදහසක්" (10), "කෝටියක්" (32) වැනි පද මීට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

ධාතු ප්‍රකෘතියකට ප්‍රත්‍ය එක් වීමෙන් සැකසෙන නාම කෘදන්ත නාම නම් වේ. " දන්වන්නෙක්" (68) "කියන්නවුන්" (70), " දිනුවෝ" (92) ආදිය මීට නිදසුන් වේ.

නාම පද වාක්‍ය සංස්ථිතිය කෙරෙහි විවිධාකාරයෙන් බලපායි. මෙහි දී නාම පදවල ප්‍රාණ-අප්‍රාණභේදය, ලිංග භේදය, වචන භේදය, නියත-අනියත භේදය හා විභක්ති භේදය යන ව්‍යාකරණ ලක්ෂණ මගින් වාක්‍ය සංස්ථිතිය කෙරෙහි ඇතිවන බලපෑම බෙහෙවින් වැදගත් වේ.

ප්‍රථමා, කර්ම, කර්තෘ, කරණ, සම්ප්‍රදාන, අවධි, සම්බන්ධ, ආධාර හා ආලපන යන විභක්ති නවයට ම අයත් නාම පද බුත්සරණෙහි දක්නට ලැබේ. එයින් සනාථ වන්නේ මෙම ග්‍රන්ථය රචනා වූ අවධිය වන විට සිංහල භාෂාව තුළ සියලු විභක්ති සැකසී තිබූ බවයි. විභක්ති භේදය වඩාත් පැහැදිලි වන්නේ වාක්‍ය තුළ ඒවා යෙදී ඇති ආකාරය අනුව ය.

ප්‍රථමා විභක්තිය - "ආළවකයා .. එ ආයුධය දූමී යැ." (149)

කර්ම විභක්තිය - "... සවාමි දරුවෝ .. සත්ත්වයන් දුකින් ගලවති." (66)

කර්තෘ විභක්තිය - "... සතර ඍද්ධි පාදයෝ මා විසින් භාවනා කරන ලදහ." (90)

කරණ විභක්තිය - "... පහණින් ගසා භයගත්වාපී නියාත් ඉතා යහපති, ..." (148)

සම්ප්‍රදාන විභක්තිය - "බුදුරජාණන් වහන්සෙ එ ස්ත්‍රීන්ට මධුර කොටැ බණ වදළ සේකැ." (140)

අවධි විභක්තිය - "දියෙන් ගිනි නො නැඟිගයි, ගිනිකිඳින් දියබිඳු නො ඉසෙයි, ," (160)

සම්බන්ධ විභක්තිය - "... දෙවියන් ඇස නිවීගියෙ, බඹුන් සිත් සැනැහීගියෙ, ..." (116)

ආධාර විභක්තිය - "දෙව් බඹහු උඩ අහසැ අපොළන්නට වන්හ." (80)

ආලපන විභක්තිය - "... බිසවුනි, .. නොයෙක් රන් රුවන් රක්ෂා කොටැ තබව් ..." (325)

සම්බන්ධ විභක්තියට අයත් අයත් නාම පද සමඟ 'ගෙ' නිපාතය බොහෝ විට යෙදුණ ද ඇතැම් විට මෙම නාම පද ප්‍රත්‍ය රහිත ව යෙදීම ද පුරාතනයේ පටන් මේ දක්වා ම සිංහලයේ දක්නට ලැබෙන්නකි. බුත්සරණෙහි සඳහන් "යක්ෂයා මත්" (64), "දෙවියන් ඇස්" (112), "බඹුන් සිත්" (116), "සිංහයන් ඇඟැ" (172) හා"යකින්නන් තනය" (274) ආදිය මේ පිළිබඳ නිදසුන් වේ.

බුත්සරණෙහි ඇතැම් අප්‍රාණවාචී නාම පදවලට ප්‍රාණත්වාරෝපණය වී ආලපන විභක්තියෙහි යෙදී ඇත. එ සේ ම ආලපන විභක්තියට අයත් ප්‍රාණවාචී හා අප්‍රාණවාචී නාම පද මිශ්‍රව ද යෙදී තිබෙනු දැකිය හැකි ය.

උදා:"... වන මෘගයෙනි, කෙලි වළඳිනි, හතර ස් පොකුණෙනි අදින් තොප කෙරෙන් වියො වූම්හ ..." (350)

ද්වි විභක්තික ප්‍රයෝග ද බුත්සරණෙහි දක්නට ලැබේ. ද්වි විභක්තික ප්‍රයෝග යනු සමාන නාම ශබ්දය විභක්ති රූප දෙකකින් යෙදීම් වශයෙන් පුනරුක්ත වීමයි (කරුණාතිලක 2003:244).

උදා: අවධි-සම්ප්‍රදාන විභක්ති - "... තකතින් තකතට වැරැද එළැඹෙන චන්ද්‍රයා සෙ ..." (37)

අවධි-ආධාර විභක්ති - "... මඬුවෙන් මඬුවෙහි සත්රුවන් ආසන යැ, ... (188)

සමස්තයක් වශයෙන් ගත් විට අප්‍රාණවාචී නාම ප්‍රත්‍ය බහුල ව යෙදී ඇත්තේ ඒකවචනයෙහි පමණි. ඒවා දක්නට ලැබෙන්නේ ප්‍රථමා, කර්ම, කරණ, සම්ප්‍රදාන, අවධි හා ආධාර යන විභක්තිවල ය. අප්‍රාණවාචී බහුවචන නාමප්‍රත්‍ය ඉතා දුර්ලභ වේ. වර්තමානයේ අප්‍රාණවාචී බහුවචන නාම

පදවල 'වල්' ප්‍රත්‍ය යෙදේ. බුත්සරණේ සඳහන් 'වැව් අමුණුවලැ' (165), 'කොටගෙවලැ' (165) යන පද තුළ එහි ඡායාවක් ගැබ් ව පවතී. පුරාතන භාෂා ස්වරූපයෙන් භාෂාව කෙමෙන් වෙනස් වන අන්දම එ තුළින් පසක් කර ගත හැකි ය.

## ක්‍රියා පද

යම්කිසි කිරීමක් හෝ විඳීමක් හෝ සිදුවීමක් හෝ දක්වන පද විශේෂය 'ක්‍රියා පද' යනුවෙන් හැඳින් වේ. මානව භාෂාවෙහි පද වර්ගීකරණයේ දී දක්වෙන ප්‍රධාන පද ප්‍රභේදයක් වන මෙය වාක්‍යයක ආඛ්‍යාත ස්ථානයෙහි යෙදෙන, ධාතු මූලික වූ කේන්ද්‍රීය පදයයි (කරුණාතිලක 2003:173).

ක්‍රියාපදවල පුරුෂ භේදය, වචන භේදය, කාල භේදය, ලිංග භේදය, සකර්මක-අකර්මක භේදය, සක්‍රීය-අක්‍රීය භේදය, කේවල-සංයුක්ත භේදය, කාරක භේදය යන ව්‍යාකරණ ලක්ෂණ දක්නට ලැබේ.

ක්‍රියාපද 'උත්තම පුරුෂ', 'මධ්‍යම පුරුෂ' හා 'ප්‍රථම පුරුෂ' යන පුරුෂත්‍රයෙහි වරනැගේ. උත්තම පුරුෂ ඒකවචන ක්‍රියාප්‍රත්‍යයක් ලෙස 'මි' යන්න ද, උත්තම පුරුෂබහුවචන ක්‍රියාප්‍රත්‍ය ලෙෂ 'මිහ', 'මහ' ආදිය ද, මධ්‍යම පුරුෂ ඒකවචන ක්‍රියාප්‍රත්‍ය ලෙස'හි', 'යි' ආදිය ද, මධ්‍යම පුරුෂ බහුවචන ක්‍රියා ප්‍රත්‍ය ලෙස 'වු', 'ව', 'හු', 'යි' ආදිය ද, ප්‍රථම පුරුෂ ඒකවචන ක්‍රියාප්‍රත්‍යයක් ලෙෂ 'අ', 'ඇ', 'ඉ', 'ඊ', 'එ' ආදිය ද, ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියාප්‍රත්‍යයක් ලෙස 'ඔ', 'හු', 'ති', 'හ', 'ත්' ආදිය ද බුත්සරණෙහි යෙදී ඇත.

මෙම ප්‍රත්‍ය සහිත උත්තම පුරුෂ ඒකවචන ක්‍රියා පද ලෙස "දක්මි" (8),"කළෙමි" (24) ආදිය ද, උත්තම පුරුෂ බහුවචන ක්‍රියා පද ලෙස " දන්මහ" (68), "කියම්හ" (199) ආදිය ද, මධ්‍යම පුරුෂ ඒකවචන ක්‍රියා පද ලෙස "සිටිහි" (150), "කෙරෙයි" (336) ආදිය ද, මධ්‍යම පුරුෂ බහුවචන ක්‍රියා පද ලෙස "අසවු" (23), "අදුව" (331), "රජවුහු" (67) ආදිය ද, ප්‍රථම පුරුෂ ඒකවචන ක්‍රියා පද ලෙස "නස්නෙ යැ" (56), "රක්කි" (136), "ගත" (123), "කෙළෙ" (104), " සෙල්වී" (104) ආදිය ද, ප්‍රථම පුරුෂ බහුවචන ක්‍රියා පද ලෙස "සිතති" (24), "අසත් " (215), "මළහ" (15), "විචාළො" (136), "ගියාහු යැ" (331) ආදිය ද දැක්විය හැකි ය.

කාල භේදය අනුව 'අතීතකාල ක්‍රියා පද' හා 'අනතීත කාල ක්‍රියා පද' යනුවෙන් සිංහල ක්‍රියා පද දෙයාකාර වේ. "කෙළෙමි"(24), " විචාළො" (136) ආදිය අතීත කාල ක්‍රියා පද සඳහා ද, "ගසාපියමි" (145), "පැතිරෙයි" (53) ආදිය අනතීත කාල ක්‍රියා පද සඳහා ද නිදසුන් වේ.

සකර්මක-අකර්මක භේදය විශ්වීය භාෂා ලක්ෂණයකි. මෙම භේදය පවතින්නේ ක්‍රියා පදය කර්මයක් අපේක්ෂා කරන්නේ ද? නැද්ද? යන කරුණ මතයි. සකර්මක-අකර්මක භේදය වඩාත් පැහැදිලි වන්නේ එම ක්‍රියා පද වාක්‍යවල යෙදෙන විට ය. 'සකර්මක ක්‍රියා පද' යනු කර්මයක් අපේක්ෂා කරනු ලබන ක්‍රියා පදයි. මෙම ක්‍රියා පද සැකසී ඇත්තේ සකර්මක ධාතූන් ඇසුරිනි. දක්මි" (86), " වදති."(135,136) ආදිය මේ පිළිබඳ නිදසුන් ය. 'අකර්මක ක්‍රියා පද' යනු කර්මයක් අපේක්ෂා නොකරන ක්‍රියා පදයි. මෙම ක්‍රියා පද සැකසී ඇත්තේ අකර්මක ධාතූන් ඇසුරිනි. "පැනෙයි" (252), "බස්සි" (57)ආදිය අකර්මක ක්‍රියා පද වේ.

ක්‍රියා පදයක සක්‍රීය-අක්‍රීය භේදය ඇති වන්නේ යම් ක්‍රියාවක් සඳහා කර්තෘ සහභාගි වන්නේ ද? නොවන්නේ ද? යන කරුණ මතයි. සක්‍රීය-අක්‍රීය භේදය ද වඩාත් පැහැදිලි වන්නේ එම ක්‍රියා පද වාක්‍යවල යෙදෙන විට ය. කර්තෘගේ සහභාගීත්වයෙන් සිදු කරනු ලබන ක්‍රියා 'සක්‍රීය ක්‍රියා' නම් වේ. කර්තෘ විසින් මෙම ක්‍රියා සිදුකරනු ලබන්නේ යම් කිසි උත්සාහයකින් යුක්තව ය. "කයි." (35), " ගනිති." (59) ආදිය සක්‍රීය ක්‍රියා වේ. කර්තෘගේ සහභාගීත්වයෙන් තොර ව සිදු කෙරෙන ලබන ක්‍රියා 'අක්‍රීය ක්‍රියා' යනුවෙන් හැඳින් වේ. "නැඟෙයි" (57), "සිඳෙයි" (138) ආදිය මේ පිළිබඳ නිදසුන් ය.

ක්‍රියා පද රූපීය වශයෙන් 'කේවල' හා 'සංයුක්ත' යනුවෙන් දෙ වැදෑරුම් වේ. 'කේවල ක්‍රියා පද' යනු තනි ක්‍රියාවකින් සමන්විත ක්‍රියා පදයි."කෙරෙයි"(337), "අසති" (214)ආදියමීට නිදසුන් වේ.

ක්‍රියා දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකතු වී සැකසෙන ක්‍රියා පද 'සංයුක්ත ක්‍රියා පද' නම් වේ. භාෂාවේ ක්‍රියා පද නොමැති විට පූර්ව ක්‍රියා පදයකට පරව උපකාරක ක්‍රියා පදයක් යොදා මෙම ක්‍රියා පද සකසා ගනු ලැබේ. පාලි, සංස්කෘත භාෂාවල ද සංයුක්ත ක්‍රියා පද දැකිය හැකි ය. ගැටපදවල පාලි, සංස්කෘත ක්‍රියා පදවලට අදාළ සිංහල ක්‍රියා පද නොමැති විට සංයුක්ත ක්‍රියා පද සකසා

ගනු ලැබේ. සංයුක්ත ක්‍රියා පද දෙ වැදෑරුම් කොට දක්විය හැකි ය. එ නම් කෙරෙයි, වෙයි යන උපකාරක ක්‍රියාසහිත සංයුක්ත ක්‍රියා පද හා ගනියි, පියයි, ලයි, යන උපකාරක ක්‍රියා පද සහිත සංයුක්ත ක්‍රියා පද යනුවෙනි.

මෙහි දී කෙරෙයි, වෙයි යන උපකාරක ක්‍රියා හා එක්වන ක්‍රියා පද මෙන් ම සංයුක්ත ක්‍රියා පදය ද අර්ථවත් වේ. "ස්පර්ධාකරම්හ" (99), "වක් වෙයි" (252) ආදිය මීට නිදසුන් ලෙස දැක්විය හැකි ය.

එහෙත් ගනියි, පියයි, ලයි, යන උපකාරක ක්‍රියා පද සහිත සංයුක්ත ක්‍රියා පදවල එය සැකසීමට යෙදෙන පූර්ව ක්‍රියාව අර්ථවත් වන අතර ඊට එක්වන උපකාරක ක්‍රියාව අර්ථ විරහිත වේ. එම උපකාරක ක්‍රියාව මගින් පූර්ව ක්‍රියාවේ අර්ථයට සුළු වශයෙන් ප්‍රබල අර්ථ ඡායාවක් දෙනු ලැබේ. "මවාගන්නෙ යැ" (52), "ගසාපියමී" (151), "දමාලී යැ" (222) ආදිය මේ පිළිබඳ නිදසුන් ය.

වාක්‍යයක් නිම කිරීම පිණිස යෙදෙන ක්‍රියා පද අවසාන ක්‍රියා පද නම් වේ. භාෂාවක ක්‍රියා පද සාකච්ඡා කිරීමේ දී බොහෝ විට කේන්ද්‍රීය සංරචකය ලෙස සැලකෙනුයේ අවසාන ක්‍රියා පදයි. මෙම ක්‍රියාපද යොදනු ලබන්නේ වාක්‍යයක 'ආඛ්‍යාතය' වශයෙනි. එහෙයින් වාක්‍යයක අවසාන ක්‍රියා පදයත්, උක්තය ලෙස යෙදෙන නාම පදයත් අතර අනුරූපතාවක් පවතී.

සිංහල භාෂාවට අයත් අවසාන ක්‍රියාවල විවිධ ප්‍රභේද දක්නට ලැබේ. එනම් විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා සහ ප්‍රයෝජ්‍ය ක්‍රියා යනුවෙනි.

යම්කිසි විධානයක් දීම සඳහා භාවිත වන ක්‍රියා පද 'විධි ක්‍රියා' නම් වේ. මෙහි දී ඇතැම් විට කර්තෘ අධ්‍යාහාරයෙන් ගත යුතු ය.

විධි ක්‍රියා සම්බන්ධයෙන් සංඛ්‍යා භේදය හෙවත් ඒකවචන, බහුවචන භේදය දක්නට ලැබේ. මෙහි අස්ත්‍යර්ථ විධි ක්‍රියා මෙන් ම නිෂේධාර්ථ විධි ක්‍රියාද දැකිය හැකි ය.

උදා:"... ආළවකයා ගෙ දූඩිකම් තො මට නො කිය,"..." (138)

"... තෙපි රැහැණි නොවවූ"..." (327)

'ආශිර්වාද ක්‍රියා' යනු යමෙකුට ආශිංසනය කිරීම සඳහා භාවිත වන ක්‍රියා පදයි. මෙම ක්‍රියා පද පුරුෂත්‍රයෙහි හා වචනද්වයෙහි වර නැගේ (පඤ්ඤසාර හිමි 2004:174). බුත්සරණෙහි අස්ත්‍යර්ථ ආශිර්වාද ක්‍රියා සහ නිෂේධාර්ථ ආශිර්වාද ක්‍රියා මිශ්‍රව ද දක්නට ලැබේ.

උදා:"... මහාසාගරයෙහි අපිත් නො ගැලෙමොව'යි;... අපි දූසැනැහෙමොව'යි;"..." (133)

"... සියලු සත්හු මා කරා පැමිණැ ජීවත් වෙත්ව'යි...." (355)

කිසිවකුගේ මෙහෙයවීම යටතේ සිදු කරනු ලබන ක්‍රියා 'ප්‍රයෝජ්‍ය ක්‍රියා' යනුවෙන් හැඳින් වේ. (කුමාරතුංග සහ ගුණවඩු 1995:396) ප්‍රයෝජ්‍ය ක්‍රියා ද පුරුෂත්‍රයෙහි හා වචනද්වයෙහි වරනැගේ. බුත්සරණෙහි උත්තම පුරුෂයට හාප්‍රථම පුරුෂයට අයත් ප්‍රයෝජ්‍ය ක්‍රියා දක්නට ලැබේ.

උදා:"මම ත් තුඹ වහන්සේට මණ්ඩපයක් කරවමි"..."(101)

ප්‍රථම පුරුෂයට අයත් ප්‍රයෝජ්‍ය ක්‍රියා සහිත වාක්‍ය අතර 'ලවා' නිපාතය සහිත වාක්‍ය මෙන් ම 'ලවා' නිපාතය රහිත වාක්‍ය ද දක්නට ලැබේ. මෙ සේ 'ලවා' නිපාතය යොදනු ලබන්නේ ක්‍රියාව මෙහෙයවනු ලබන්නා දැක් වීමට ය. එම නිපාතය රහිත වාක්‍යවල දී එය අධ්‍යාහාරයෙන් ගත යුතු ය.

'ලවා' නිපතය රහිත වාක්‍ය - "යක්ෂ ද කුමාරයා තෙසරණ ගැන්වී යැ."(160)

'ලවා' නිපාතය සහිත වාක්‍ය -"... රත්රන් අමුරන් ආදි වූ ධනය සියලු ලොවැස්සන් ලවා සම්භාවනා කරවන්නෙ යැ."(152)

බුත්සරණෙහි අන්තර්ගත ප්‍රයෝජ්‍ය ක්‍රියා සහිත වාක්‍ය අතර බහුතරය අස්ත්‍යර්ථ වාක්‍ය ය. මීට අමතර ව නිෂේධාර්ථ වාක්‍ය කිහිපයක් ද එහි දක්නට ලැබේ. ඉහත අවසන් වැකි දෙක නිෂේධාර්ථ වාක්‍ය වන අතර ඉතිරි සියල්ල අස්ත්‍යර්ථ වාක්‍ය වේ.

කෘදන්ත ද වාක්‍යාවසාන ක්‍රියා පද ලෙස පුරුෂත්‍රයෙහි, වචනද්වයෙහි හා කාලද්වයෙහි වරනැගේ.

උදා:"... මැණියො දි .. පුතණුවන් සනහසනහා ඔත්තෝ යැ." (13)

කාරක භේදය අනුව වාක්‍ය ප්‍රයෝග දෙ වැදෑරුම් වේ. එ නම් කර්තෘකාරක වාක්‍ය සහ කර්මකාරක වාක්‍ය යනුවෙනි. කර්තෘ උක්ත වන කර්මය අනුක්ත වන වාක්‍ය හැඳින්වෙන්නේ කර්තෘකාරක වාක්‍ය වශයෙනි. මෙහි දී උක්ත කර්තෘට අනුව

ආඛ්‍යාතය තබනු ලැබේ. බුත්සරණෙහි පුරුෂ ලිංග, ස්ත්‍රී ලිංග හා අප්‍රාණවාචී කර්තෘකාරක වාක්‍ය දක්නට ලැබේ.

උදා:"දෙවතාවෝ මිනිසුන් දකිති, මිනිස්සු දෙවතාවන් දකිති." (116)

කර්මකාරක වාක්‍ය යනුවෙන් හැඳින්වෙන්නේ කර්තෘ අනුක්ත වන කර්මය උක්ත වන වාක්‍යයි. මෙහි දී උක්ත කර්මය ප්‍රථමා විභක්ති ගන්නා අතර ඊට අනුව ආඛ්‍යාතය තබනු ලැබේ. කර්මකාරකයෙහි යෙදෙන්නේ සකර්මක ක්‍රියාවයි. කර්මයක් රහිත බැවින් අකර්මක ක්‍රියා කර්මකාරකයෙහි නොයෙදේ. මෙහි දී 'ලද', 'ලබ' ධාතුන්ට පෙර යෙදෙනුයේ වර්තමාන කෘදන්ත පදයි. තව ද කර්මකාරක වාක්‍යවල කර්තෘ අප්‍රධාන වේ. ඇතැම් කර්මකාරක වාක්‍යවල කර්තෘ පදයක් නොමැත්තේ එහෙයිනි.

උදා:"... සතර සෘධි පාදයෝ මා විසින් භාවනා කරන ලදහ." (90)

වාක්‍යයක් අවසන් කිරීම පිණිස නොයෙදෙන ක්‍රියා පද 'අනවසාන ක්‍රියා' යනුවෙන් හැඳින් වේ. එම ක්‍රියා රූප හා වාක්‍යයෙහි උක්තය වශයෙන් යෙදෙන නාම පදය අතර අනුරූපතාවක් දක්නට නොමැත. එහෙත් ධාතු ප්‍රකෘතියක් මුල් වී සැකසී ඇති බැවින් මෙම පද අනවසාන ක්‍රියා ලෙස සැලකේ. අනවසාන ක්‍රියා රූප වාක්‍ය තුළ පවතින සංරචක ඉදිරියට ගෙනයාම සඳහා උපකාරී වේ. දීර්ඝ වාක්‍යයක් ඉදිරිපත් කිරීමේ දී වාක්‍ය තුළ ඇති වාක්‍යාංශ අවසන් වන්නේ මෙම අනවසාන ක්‍රියා රූපවලිනි. සිංහල භාෂාවේ පවතින අනවසාන ක්‍රියා රූපවලට වාක්‍ය විචාරයේ වැදගත් තැනක් හිමි වේ. සිංහල භාෂාවේ දක්නට ලැබෙන අනවසාන ක්‍රියා රූප ලෙස පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා සහ අසම්භාව්‍ය ක්‍රියා දැක්විය හැකි ය.

අවසාන ක්‍රියාවට පෙර සිදුකර නිම කරන ලද ක්‍රියා 'පූර්ව ක්‍රියා' යනුවෙන් හැඳින් වේ. ආරම්භයේ සිට සිංහල ගද්‍ය ආඛ්‍යානවල කැපී පෙනෙන ලක්ෂණයක් වන පූර්ව ක්‍රියා යොදනු ලබන්නේ අදාළ ක්‍රියා සිදුවන අනුපිළිවෙළට ය.

උදා: "එ බස් අසා, මිනිසුන් බූමාටු දෙවතාවන් ආදි වූ සත්ත්වයො පින් කොටැ දෙව් ලොවැ ඉපිද එහි දී ලබන ධ්‍යානයෙන් බඹලෝ යෙති."(57)

පූර්ව ක්‍රියාවල වරනැගීම් ස්වරූපයක් හෝ ලිංග, වචන, පුරුෂාදී කිසිදු භේදයක් හෝ දක්නට නොමැත. මුනිදාස කුමාරතුංග මහතා ක්‍රියා විවරණය නම් ග්‍රන්ථයේ 'අතීත නිපාත ක්‍රියා' යනුවෙන් පූර්ව ක්‍රියා හඳුන්වා ඇත්තේ එහෙයිනි (පඤ්ඤාසාර හිමි 2004:188,189).

අවසාන ක්‍රියාවට සමගාමී ව සිදු කරනු ලබන ක්‍රියා 'මිශ්‍ර ක්‍රියා' යනුවෙන් හැඳින් වේ. පූර්ව ක්‍රියාව ද්විත්ව වීමෙන් ද, ධාතු ප්‍රකෘතියට පරව 'මින්' යන ප්‍රත්‍ය යෙදීමෙන් ද මිශ්‍ර ක්‍රියා සැකසේ. පූර්ව ක්‍රියාව ද්විත්ව වීමෙන් මිශ්‍ර ක්‍රියා සැකසෙන අවස්ථාවල දී පළමු පූර්ව ක්‍රියාවේ අන්තය හ්‍රස්ව වෙයි. දෙ වන පූර්ව ක්‍රියාව පූර්ව ක්‍රියා ස්වරූපයෙන්ම තබනු ලැබේ.

උදා: "... බෝසාතාණන් මෑණියො ද".. පුතණුවන් සනහසනහා ඔත්තෝ යැ." (13)

පූර්ව ක්‍රියා ද්විත්ව වීමෙන් සැකසුණු මිශ්‍ර ක්‍රියා සහ ධාතු ප්‍රකෘතියට පර ව 'මින්' ප්‍රත්‍ය එකතුවීමෙන් සැකසුණු මිශ්‍ර ක්‍රියා මිශ්‍ර ව පවතින වාක්‍ය ද බුත්සරණෙහි බහුල ව දැකිය හැකි ය.

උදා: "... දෙව් මිනිසුන් ගසන මිහිගු බෙර හඬින් හා විදුවිදු,. යන මහබඹ පිරිවරින් හා පරසතුමල් දමමින් මදාරා මල් ඉසිමින් තල්වැට-චාමර සලමින් ,,"(39-41)

මිශ්‍ර ක්‍රියාවල වරනැගීම් ස්වරූපයක් හෝ ලිංග, පුරුෂ වචනාදී කිසිදු භේදයක් හෝ දක්නට නොමැත. මුනිදාස කුමාරතුංග ක්‍රියා විවරණය නම් ග්‍රන්ථයෙහි 'වර්තමාන නිපාත ක්‍රියා' යනුවෙන් ද 'මිශ්‍ර ක්‍රියා' හඳුන්වා ඇත්තේ එහෙයිනි (පඤ්ඤාසාර හිමි 2004:186).

'අසම්භාව්‍ය ක්‍රියා' මගින් ඉන් පසුව සඳහන් වන ක්‍රියාව රඳා පවතින්නේ කුමක් මත ද? යන්න දැක්වීම හෝ යම්ක්‍රියාවක් සිදුවන්නේ කුමන ක්‍රියාවක් සිදුවන විට ද? යන්න දැක්වීම හෝ සිදු වේ. අසම්භාව්‍ය ක්‍රියා සහිත වාක්‍යවල අන්තර් වාක්‍යයේ කර්තෘ අනුක්ත රූපයෙන් යෙදේ. ප්‍රධාන වාක්‍යයේ උක්තය හා ආඛ්‍යාතය සාමාන්‍ය රීතියට අනුකූල ව තබනු ලැබේ. අසම්භාව්‍ය ක්‍රියා දෙයාකාර ය. එ නම් 'අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා' සහ කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා යනුවෙනි. 'අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා' මගින් සිදුවන්නේ ඉන් පසු ව සඳහන් වන ක්‍රියාව රඳා පවතින්නේ කුමක් මත ද? යන්න දැක්වීමයි. අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාවට පරව 'හොත්' හෝ 'තොත්' ප්‍රත්‍ය යෙදී ඇත.

උදා:"... දෙවියකු වැඳැගෙනැ හොත තුන්කෙළ සැට ලක්ෂයක් හවුරුද්දට ආයු දීලති,"..."(173)

'කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා' මගින් යම්ක්‍රියාවක් සිදුවන්නේ කුමන ක්‍රියාවක් සිදුවන විට ද? යන්න දැක්වීම සිදු වේ. ධාතු ප්‍රකෘතියට පරව 'ත්' ප්‍රත්‍යය යෙදීමෙන් ද, විශේෂ පදයකින් තොරව කෘදන්ත රූපය පමණක් යෙදීමෙන් ද, කෘදන්ත රූපය ද්විත්ව වී යෙදීමෙන් ද, 'දී' ප්‍රත්‍යය යෙදීමෙන් ද බුත්සරණෙහි කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා සැකසී ඇත.

උදා: "... මෙසෙ සිතත් සිතත් දෙලක්ෂසතළිස්දහසක් ඝනකඩ බොල් මහ පොළොව අනෙක ගර්ජනා කෙරෙමින් අත් බමරක් සෙ සතුටු වැ නටන්නට වන." (320)

අසම්භාව්‍ය ක්‍රියාවල වරනැඟීම් ස්වරූපයක් හෝ ලිංග, පුරුෂ, වචන භේදයක් හෝ දක්නට නොමැත. මුනිදාස කුමාරතුංග මහතාගේ ක්‍රියා විවරණය නම් ග්‍රන්ථයෙහි 'ආවස්ථික නිපාත ක්‍රියා' යනුවෙන් අසම්භාව්‍ය ක්‍රියා හඳුන්වා ඇත්තේ එහෙයනි (පඤ්ඤාසාර හිමි 2004:186).

කෘදන්ත රූප නාම විශේෂණ ලෙස බහුලව භාවිත වේ.

උදා:"එ වධ කරන පුරුෂයා මහනෙල් මල් පෙති සෙ අත් පා කපාහරී ල." (14)

"... අධික වූ තෙජස් ලදින් බැබළුණු 'බුදුන් සරණ යෙමි'"..." (281)

මීට අමතර ව බුත්සරණෙහි කෘදන්ත රූප පුරුෂත්‍රයෙහි හා වචනද්වයෙහි වරනැඟී නාම විශේෂණ වශයෙන්ද යෙදේ. පළමු ව නාම පදයක් ද, ඉන් අනතුරු ව කෘදන්ත නාමයක් ද යෙදී ඇති මෙම වාක්‍ය සංස්ථිතිය බුත්සරණෙහි සුලබ ව දක්නට ලැබේ. මෙහි දී වර්තමාන කෘදන්ත නාම වාක්‍යාංශය මගින් සිදුවෙමින් පවතින ක්‍රියාවලිය පිළිබඳ හැඟීම වඩාත් හොඳින් ප්‍රකාශ වන අතර අතීත කෘදන්තය මගින් අතීතයට අයත් ක්‍රියාකාරකමක් හෝ පැවති අඛණ්ඩ ක්‍රියාකාරකමක් හෝ පැවති සංසිද්ධියක් හෝ දක්වනු ලැබේ (විජේමාන්න 2010:225).

උදා: "... ඇපි හැම කැටි වැ පරීක්ෂා කරන්නමො මෙ සා මහත් විපත්තියට කාරණ වූ කිසි දෙෂයක් නො දුටුම්හ"..." (169)

ධාතුවක් මුල් කර නොගත් ආඛ්‍යාත සහිත වාක්‍ය ද බුත්සරණෙහි දක්නට ලැබේ. 'ඇත', 'නැත', 'හැකි', 'යුතු' යන ප්‍රච්ඡන්න ක්‍රියා රූප ද, 'මනා', 'විරූ' යන අර්ධ විශේෂණ රූප ද, නාම පද සහ නාම විශේෂණ ද ආඛ්‍යාත ලෙස යෙදී ඇති වාක්‍ය මේ පිළිබඳ නිදසුන් වේ.

'ප්‍රච්ඡන්න ක්‍රියා' යනු ක්‍රමික ක්‍රියා ධාතුවල මෙන් පූර්ණ වරනැඟීම් නොදක්වෙන, එහෙත් ක්‍රියා පදවල යෙදීම්වලට අනුරූප වූ යම් ලක්ෂණ දරන පදයි. සිංහල භාෂාවේ මෙ බඳු ක්‍රියා රූප කිහිපයක් පවතී. 'ඇත', 'නැත', 'හැකි', 'යුතු' යන ප්‍රච්ඡන්න ක්‍රියා රූප මීට නිදසුන් වේ. ප්‍රාණවාචී උක්ත පද සමඟ මෙන් ම අප්‍රාණවාචී උක්ත පද සමඟ ද මෙම ආඛ්‍යාත රූප භාවිත වේ. මෙම 'ප්‍රච්ඡන්න ක්‍රියා' රූපවල වචන භේදයක් සහ පුරුෂ භේදයක් ඇතත් කාල භේදයක් නොමැත. (කරුණාතිලක 2003:202, 203).

'ඇත' යෝගයෙහි 'සිටියි', 'පවතියි', 'විද්‍යමාන වේ' යන අර්ථ ගැබ් ව පවතී. 'ඇත' යන්න මෙන් ම 'ඇති' යන එහි විකල්ප රූපයත් බුත්සරණෙහි දක්නට ලැබේ. මෙහි දී කර්තෘ උක්ත රූපයෙන් තැබිය යුතු ය (විජේමාන්න 2010:223).

'ඇත', 'ඇති' යන පද ඇතැම් විට ආඛ්‍යාතය වශයෙන් යෙදෙනුයේ කිසිදු වරනැඟීමකින් තොරව ය. මෙය දක්නට ලැබෙනුයේ ප්‍රථම පුරුෂයේ පමණි.

උදා:"... මෙහි විෂඝොර වූ එක් නාග රාජයෙක් ඇත,"..."(122)

මීට අමතර ව 'ඇත', 'ඇති' යන පද පුරුෂ, වචන හා ලිංග අනුව වරනැඟී ද ක්‍රියා රූප වශයෙන් යෙදේ.

උදා:"... මම බොහො කලක් නො නැමෙන් කිලුටු වැ ගිය ශරීර ඇත්තෙමි,"..." (64)

'නැත' හා 'නැති' යන නිෂේධාර්ථ රූප ද ඇතැම් විට කිසිදු වරනැඟීමකින් තොර ව ආඛ්‍යාතය වශයෙන් යෙදේ. මෙහි දී ද කර්තෘ උක්ත රූපයෙන් තැබිය යුතු ය.

උදා:"... මම සතුන් කෙරෙහි කරුණා නැත්තෙමි,"..."(213)

යමක හෝ යමෙකුගේ හෝ පැවැත්ම බලපාන්නේ කාට ද? යන්න දැක්විය යුතු අවස්ථාවල දී සම්ප්‍රදාන විභක්තියට අයත් නාමයක් යොදනු ලැබේ.

උදා:"... <u>මට</u> ධම්පාලයා මුත් අනෙක් සතුරෙක් නැත,ි..." (13)

'හැකි' යන ප්‍රච්ඡන්න ක්‍රියා රූපය 'හැක්කැ' යනුවෙන් තරමක් වෙනස් ව බුත්සරණේ අස්ත්‍යර්ථ හා නිෂේධාර්ථ වාක්‍යවල දක්නට ලැබේ. මෙම ක්‍රියා රූපයට පෙර බොහෝ විට යෙදෙනුයේ කෘදන්ත ය.

උදා:"... ආළවකයා ගෙ දැඩිකම් .. ආවක් දැක්ක හැක්කැ,ි..."(138)

'යුතු' යන ප්‍රච්ඡන්න ක්‍රියා රූපය එම ස්වරූපයෙන් මෙන් ම පුරුෂ, වචන හා ලිංග භේද අනුව විවිධාකාරයෙන් වරනැගීද වාක්‍යවල යෙදේ. මෙම ක්‍රියා රූප ද යෙදෙනුයේ කෘදන්ත රූපවලට පරව ය.

උදා:"මේ ධම්යෝ මෙනෙහි කටයුත්තාහැ, මේ ධම්යෝ දුරු <u>කටයුත්තාහැ.</u>"(27)

'මනා', විරූ', 'යහ' යන රූප ඇසුරින් සැකසුණු ආඛ්‍යාත අර්ධ විශේෂණ රූපගණයට අයත් වේ. මනායන ක්‍රියා රූපය තුළ කාරුණික ව කෙරෙන ආයාචනයක ස්වරූපය ගැබ් ව පවතී. 'විරූ' යන්න ද පුරුෂ, වචන හා ලිංග භේද අනුව වරනැගී ආඛ්‍යාතය වශයෙන් යෙදේ. 'යහ'යන අර්ධ විශේෂණ රූපය යෙදෙනුයේ කෘදන්ත රූපවලට පරව ය.

උදා:"... අප රක්ෂා කළමැනැවැි..."(359)

"... මෙළඳ බොළඳ කුමාරයො කිසි දුකක් නොදුටු විරූහ."(344)

"... මහා ශ්‍රමණයන් මෙයට නාව හොත්යෙහෙකැි..."(125)

බුත්සරණෙහි ඇතැම් වාක්‍ය අවසන් වී ඇත්තේ නාම පදවලිනි. මෙම නාම පදද පුරුෂත්‍රයෙහි සහ වචනද්වයෙහි පමණක් වරනැගේ. එහි දී නාම පද අන්තයේ අදාළ ප්‍රත්‍ය යෙදේ. එ සේ ම ඇතැම් විට වාක්‍යාවසාන 'ය' නිපාතය ද යෙදෙනු දැකිය හැකි ය.

උදා: "ඒ නුග රුක ද ආළවක යක්ෂයා සතු නුගගස යැ."(134)

බුත්සරණෙහි අන්තර්ගත ඇතැම් වාක්‍යවල ආඛ්‍යතය ලෙස යෙදී ඇත්තේ නාම විශේෂණයි. නාම විශේෂණ ද පුරුෂත්‍රයෙහි සහ වචනද්වයෙහි පමණක් වරනැගේ. මෙහි දී ද අදාළ ප්‍රත්‍ය නාම විශේෂණ අන්තයේ යෙදේ.

උදා: "පෙරැ සම්පත්තීන් විශාල වූ මෙ නුවර දැන් විපත්තියෙන් විශාල යැ." (137)

නාම පද හා නාම විශේෂණ වාක්‍යවල ආඛ්‍යාත සේ යෙදී ඇති කල්හි ඊට පරව 'ය', 'යැ', 'හ' ආදී වාක්‍යවසාන නිපාත පද යෙදී තිබේ.

## නිපාත

නිපාත අයත් වන්නේ අව්‍ය පද ගණයටයි. අව්‍ය පද යනු පූර්ණ වරනැගීම්වලට යොමු නොවන පදයි.

වර්තමානයේ භාවිත වන නිපාත බොහොමයක් බුත්සරණෙහි දක්නට ලැබේ.

මේ අතර 'මෙන්', 'සෙ', 'වැනි'ආදීතුල්‍යාර්ථයේ නිපාත ද, 'පිණිස', 'සඳහා' ආදී පිණිසාර්ථයේ නිපාත ද, 'හැරැ', 'මුත්' ආදීනිශ්චයාර්ථයේ නිපාත ද, 'පටන්', 'තෙක්', 'තුරු' ආදී සීමාව හඟවන නිපාත ද,'නිසා' ආදීසාධකාර්ථයේ නිපාත ද,'න', 'නු' හා 'නො' ආදීනිෂේධාර්ථයේ නිපාත ද, 'විසින්', 'කෙරෙන්', 'ගෙන්', 'ට', 'හට', 'කෙරෙහි' ආදීවිභක්ත්‍යර්ථයේ නිපාත ද, යි. 'හෝ' සහ 'නොහොත්' ආදී විකල්පාර්ථයේ නිපාත ද, 'හොත්' සහ 'නම්' ආදී ආවස්ථිකාර්ථයේ නිපාත ද, 'ද', 'දු', 'පොවා' ආදී අවමාර්ථයේ නිපාත ද, 'වඩා' සහ 'වැඩි' ආදී තුලනාර්ථයෙහි නිපාත ද, 'පමණ', 'සා' ආදී ප්‍රමාණාර්ථයේ නිපාත ද, 'ඉතා' යන අධිකාර්ථයේ/අතිශයාර්ථයේ නිපාතය ද, 'වහා' යන ශීඝ්‍රාර්ථයේ නිපාතය ද, 'වා' ආදී ආශිර්වාදාර්ථයේ නිපාත ද, 'ල', 'ලු' ආදීශ්‍රැති සූචනාර්ථයේ නිපාත ද, දැන්', 'ඉදින්' ආදී කාලවාචක නිපාත ද, 'ම' යන අවධාරණාර්ථයේ නිපාතය ද, 'වූ කලි', 'වනාහි', ආදීමාතෘකා කිරීමේ නිපාත ද, 'සමඟ' 'කැටි වැ', ආදී සහාර්ථයේ නිපාත ද, 'ද', 'නු' ආදී ප්‍රශ්නාර්ථයේ නිපාත ද, 'ද', 'ත්' ආදී සමුච්චයාර්ථයේ නිපාත ද, 'යි', 'ද', 'ත්' ආදී සම්බන්ධාර්ථයේ නිපාත ද, 'මෙසෙ','එසෙ මැ'ආදී 'පූරණාර්ථයේ නිපාත ද, 'ය', යි, 'සේකැ' ආදී වාක්‍යාවසාන නිපාත ද, 'කොළ', 'බල'ආදීආමන්ත්‍රණාර්ථයේ නිපාත ද,'අහා', 'ඔහෝ' ආදී භාවාර්ථයේ නිපාත ද, නිශ්චිත වශයෙන් වර්ගීකරණය කළ නොහැකි 'බැගින්', 'පරිදි', 'පතා' ආදී නිපාත ද දැකිය හැකි ය.

බුත්සරණෙහි එක් අර්ථයක් සහිත නිපාත මෙන් ම විවිධ අර්ථ සහිත නිපාත ද දක්නට

ලැබේ. මෙම ග්‍රන්ථයෙහි අන්තර්ගත නිපාත බොහොමයක් වර්තමානයේ ද එම අර්ථවලින් ම භාවිත වේ.

එහෙත් බුත්සරණෙහි 'නමුත්' යන නිපාතය යෙදී ඇත්තේ වර්තමානයේ මෙන් 'එසේ වුවත්' යන අර්ථයෙන් නොව, අසම්භාව්‍ය අර්ථයෙන් හා අවධාරණාර්ථයෙනි.

උදා: "... ශ්‍රමණ ගෞතමයන් ගෙ ශ්‍රාවකයො තමන් දිවියෙ නමුත් ශික්ෂා පද නො ඉක්මෙති." (98)

"සත්පුරුෂයන් විසින් පූජා කටයුත්තෙම් නමුත් මම් මැ යැ, දිවි ලද්දෙහි එල ලද්දෙම් <u>නමුත</u> මම් මැ යැ, සංසාර දුක් දිනුයෙම් නමුත් මම් මැ යැ;..." (132)

යථෝක්ත පළමු වැකියේ අන්තර්ගත 'දිවියෙ නමුත්' යන්නෙහි අදහස 'දිවියතත්' යන්නයි. එහි ඇත්තේ අසම්භාව්‍ය අර්ථයයි. දෙ වන වැකියෙහි 'කටයුත්තෙම් නමුත්', 'ලද්දෙහි නමුත්', 'දිනුයෙම් නමුත්' ආදියෙහි ගැබ් ව ඇත්තේ පිළිවෙළින් 'කළයුත්තෙත්', 'ලද්දෙත්', 'දිනුයෙත්' යන අදහස් ය. එම පදවල ගැබ් ව ඇත්තේ අවධාරණාර්ථයයි.

තවද 'නිසා' යන නිපාතය වර්තමානයේ මෙන් සාධකාර්ථයෙහි මෙන් ම පාලි භාෂාවේ මෙන් 'ඇසුරුකොටගෙන' යන අර්ථයෙන් ද බුත්සරණෙහි යෙදී ඇත.

උදා:"... දඩ ගිය රජ්ජුරුවන් නිසා දර ගෙනෙන මිඩිය කුසැ පිළිසිඳිගෙනැ ,,"(8)

"... බුදුරජාණන් වහන්සෙ එක් සමයෙක්හි සැවැත්නුවර නිසා ජෙතවන මහා විහාරයෙහි වැඩැවසන සේක." (85)

මෙහි පළමු වැකියේ 'නිසා' යන නිපාතය සාධකාර්ථයෙහි යෙදී ඇත. එහෙත් අවසන් වැකියෙහි එම නිපාතය යෙදී ඇත්තේ 'ඇසුරුකොටගෙන' යන අර්ථයෙනි. වර්තමානයේ 'නිසා' යන නිපාතය මෙම අර්ථයෙන් භාවිත නොවන බැවින් පසු කාලයේ දී එය අභාවයට ගොස් ඇති බව පෙනේ.

මීට අමතර ව වර්තමානයේ භාවිත නොවන 'කොල', 'හම්බල', 'හෙම්බල' වැනි ආමන්ත්‍රණාර්ථයේ නිපාත හා 'පොවා' යන අවමාර්ථයේ නිපාතය ද බුත්සරණෙහි ඇතුළත් වේ.

උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය

කිසියම් වාක්‍යයක ප්‍රධාන අංග දෙක වන උක්තය හා ආඛ්‍යාතය අතර අන්‍යෝන්‍ය සම්බන්ධතාවක් පවතී. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය කෙරෙහි බලපාන ව්‍යාකරණ රීති රැසක් ඇත. මෙම රීතීන්ට අනුකූල වීම ව්‍යාකරණයේ දී අත්‍යවශ්‍ය දෙයක් බවට පත්ව පවතී. උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව වර්තමානයේ පවතින ව්‍යාකරණ රීති රැ සක් බුත්සරණෙහි ද දක්නට ලැබේ.

ඒකවචන උක්ත පද සමඟ යෙදී ඇත්තේ ඒකවචන ආඛ්‍යාත පදයි.

උදා: "තො... සොරුන් එන පෙරමඟ මහා සේනාවක් <u>මැව්හ</u>."(208)

ප්‍රාණවාචී බහුවචන උක්ත සමග යෙදෙනුයේ බහුවචන ආඛ්‍යාතයි.

උදා: "... සියලු නුවරවාසීහුරාජාඞ්ගණයෙහි රැස්වැ මහත් කොටැ හඬ ගැසූහ."(165)

අප්‍රාණවාචී ඒකවචන පදයක් හෝ බහුවචන පදයක් හෝ උක්ත වූ විට ආඛ්‍යාතය යෙදෙනුයේ ඒකවචනයෙනි. මෙය වෙනත් භාෂාවල දක්නට නොමැති, සිංහලයට ම ආවේණික වූ ලක්ෂණයකි.

උදා: "... පවන් හැමූ කලැ මකුළු හූසිඳෙයි. පලුපත් සැලෙයි;..."(138)

එහෙත් අප්‍රාණවාචී උක්තයකට 'ඕ' ප්‍රත්‍ය එකතු වී ප්‍රාණත්වාරෝපණය වී ඇති විට ආඛ්‍යාතය බහුවචනයෙන් තබනු ලැබේ.

උදා: "මේ ධම්යෝ සතර අපායෙහි හෙළති, මේ ධම්යෝ දිව්‍ය බ්‍රහ්ම ලෝකයෙහි උපදවති."(27)

ප්‍රාණවාචී ඒකවචන උක්ත පදවලට 'ඕ', 'හු' ප්‍රත්‍ය යෙදී ඇති විට ද ආඛ්‍යාතය තබනු ලබන්නේ බහුවචනයෙනි.

උදා:"... බුදුහු .. සත්හුත් ගමනින් මැ වඩිති, ..."(64)

'ආණ', 'අණු', 'අණි' යන ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍ය සහිත උක්ත පද යෙදී ඇති විට ද ආඛ්‍යාතය බහු වචනයෙන් තබනු ලැබේ. මෙහි දී ඇතැම් විට මෙම තද්ධිත ප්‍රත්‍යයන්ට පරව 'ඔ', 'ඕ' ප්‍රත්‍ය ද යෙදී ඇත.

උදා:"... සවාමිදරුවාණෝ ගඳ කිළියෙන් නික්මැ ගත්හ." (78)

නාම පද හා විශේෂණ පද ආඛ්‍යාත වශයෙන් යෙදෙන විට ඊට පුරුෂ ප්‍රත්‍ය එකතු වේ. මෙහි දී බොහෝ විට 'වෙයි' යන ක්‍රියාව අධ්‍යාහාරයෙන් ගත යුතු ය.

ගෞරවාර්ථවාචී 'වහන්සේ' යන පදය සහිත පද උක්ත වූ විට වාක්‍යාවසානයේ දී බොහෝ විට කෘදන්තයට පරව 'සේක', 'දෑය' යන පද යෙදේ.

උදා:"... පසේ බුදුන් වහන්සෙ එයට වැඩ පනවන ලද ආසනයෙහි වැඩැහී දිනා සේකැ."(46)

ස්ත්‍රී ලිංග ඒකවචන උක්ත පද සඳහා ගෞරවාර්ථයෙන් බහුවචන ආඛ්‍යාත යෙදීම ද බුත්සරණෙහි දක්නට ලැබේ.

උදා: "මද්‍රිදෙවී දරුවන් දෙබිහින්නත් අත් අල්ලා ගෙනැ වනාන්තරයට නික්මුණා හ."(331)

නිත්‍ය බහුවචන පද උක්ත වූ විට ද ආඛ්‍යාතය යොදනුයේ බහුවචනයෙනි.

උදා:"... සමහර කෙනෙක් නකත් ගණන්නා සෙ උඩු බලති."(252)

එහෙත් ඇතැම් නිත්‍ය බහුවචන පද පැහැදිලි ඒකවචන අර්ථයක් දේ නම් ආඛ්‍යාතය ඒකවචනයෙන් යෙදේ.

උදා: "... මොළොක් වූ එ අතුල්පතුල්හි මොළොක කවරෙක් කියා නිමවන්නෙද, ..."(249)

සමූහාර්ථයක් ප්‍රකාශ කරන පද උක්ත වූ විට ද ආඛ්‍යාතය යෙදෙනුයේ බහුවචනයෙනි.

උදා: "... වඳුරු පිරිස්... තුමූ නුවණැති වැ නුවණැති පිරිස් <u>ලදහ</u>;"..." (12)

සැකයක් හෝ වාර්තා අර්ථයක් ප්‍රකාශ කරන වාක්‍යවල අන්තර් වාක්‍යයේ කර්තෘ අනුක්ත රූපයෙන් ද, එහි ක්‍රියා පදය ප්‍රථම පුරුෂ බහුවචනයෙන් ද තබනු ලැබේ. ප්‍රධාන වාක්‍යයේ උක්තය හා ආඛ්‍යාතය යෙදී ඇත්තේ සාමාන්‍ය රීතියට අනුකූලව ය.

උදා: "දරුවො දෙදෙනා".. බමුණා ලුහුබැඳ එති' පසු බලමින් දිවන්නාහු".. වන ලැහැබකට වැද සැඟැවුණාහ."(345)

අසම්භාව්‍ය ක්‍රියාවක කර්තෘ පදය යෙදෙනුයේ අනුක්ත රූපයෙනි.

උදා:"... එ මහතාණන් රථය දන් දෙත් මැ රථය අදිමින් සිටි දෙවියෝ අන්තර්ධාන වූහ."(331)

දෙන, දෙනෙක් යන පද සහිත සංඛ්‍යා නාම උක්ත වූ විට ඒ හා බැඳුණු කර්තෘ උක්ත රූපයෙන් ද, ආඛ්‍යාතය බහුවචනයෙන් ද යෙදේ.

උදා:"... වලස්-වග-සිංහයො තිදෙනක් මා එත නො දී මඟ අවුරා හොත් හ."(352)

නාම ධාතුක ක්‍රියා සහිත වාක්‍යවල ඒ හා බැඳුණු ද්වි උක්ත, උක්ත රූප ගනී. මෙහි දී ප්‍රධාන උක්ත පදයට අනුකූල ප්‍රත්‍ය ගනිමින් නාම පද හා විශේෂණ පද ආඛ්‍යාත වශයෙන් යෙදී ඇත.

උදා:"... මම මී ලගින්නට නො පොහොසත්මි, ..."(344, 345)

යුතු, යුතුය යන පද ආඛ්‍යාත වශයෙන් යෙදුණු විට කර්තෘ අනුක්ත රූපයෙන් යොදනු ලැබේ.

උදා: "... මා මැණියන් මුහුණත්, සම සිත් වැ මා විසින් බැලියැ යුතු යැ,"..."(14)

එහෙත් යුතු, යුතුය යන පද නාම ආඛ්‍යාත වශයෙන් යෙදෙන විට කර්තෘ පදය තබනුයේ උක්ත රූපයෙනි.

'ඔහු', 'මොහු' යන පදය උක්ත වූ විට ආඛ්‍යාතය බහුවචනයෙන් යෙදේ.

උදා:"... මොහු බඹ ලොවට වඩිති,"..."(204)

උදා:"... මෙහි විෂඝෝර වූ එක් නාග රාජයෙක් ඇත,"..."(122)

උදා:"මේ ධම්යෝ මෙනෙහි කටයුත්තා හැ, මේ ධම්යෝ දුරු කටයුත්තාහ හැ." (27)

'ඇත', 'ඇති', 'නැත', 'නැති' යන පද ආඛ්‍යාතය වෙනුවට යෙදෙන විට ඒ හා සම්බන්ධ වන කර්තෘ උක්ත රූපයෙන් තබනු ලැබේ.

ප්‍රාණවාචී නාම පද සමුච්චයාර්ථයේ 'ද', 'ත්' සමඟ සම්බන්ධ වී උක්තය වශයෙන් පෙනී

සිටින විට ආඛ්‍යාතය යෙදෙනුයේ බහුවචනයෙනි.

උදා:"... එහි දෙවතාවො ද යක්ෂයොද උයන් කෙළි කෙළනාහ."(46)

එහෙත් සමුච්චයාර්ථයේ 'ද', 'ත්' සමඟ අප්‍රාණවාචී නාම පද සම්බන්ධ වූ විට ආඛ්‍යාතය තබනු ලබන්නේ ඒකවචනයෙනි.

උදා:"... මෙ වේලෙහි මොහු ගෙ ජවය ද දප් ය ද සිඳී ගියෙ යැ, ,," (65)

ශ්‍රැති සූචනාර්ථයේ 'ල', 'ලු' නිපාත සහිත වාක්‍යවල ද, ප්‍රශ්නාර්ථවාචී 'ද' නිපාතය සහිත වාක්‍යවල ද, ප්‍රාර්ථනාර්ථයෙහි 'ව' නිපාතය සහිත වාක්‍යවල ද උක්තාඛ්‍යාත පද සම්බන්ධය සාමාන්‍ය රීතියට අනුකූල වේ.

උදා:"(බුදුහු)... එ සොරහු වසන වල්කඩට නුදුරු තැන්හි හෝ තෙරකට පැමිණියො ලු."(63)

"... ඇපි සසරෙහි නො සිටිමො ද ?"(186)

'නම්', 'ද' යන නිපාතවලින් අන්තර් වාක්‍යයක් ප්‍රධාන වාක්‍ය සමඟ සම්බන්ධ වන විට අන්තර් වාක්‍යයේ කර්තෘ හා ක්‍රියා පදය සාමාන්‍ය පිළිවෙළට යෙදේ.

උදා:"... ශ්‍රමණ ගෞතමයො පූජාවට රැස් වූ එ මහා ජනයා මධ්‍යයෙහි සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය කළෝ නම්, එ මහා ජනයා අප කෙරෙ සරු නැති වැ යන්නාහ..." (126)

'මැනව' යන පදය අවසාන ක්‍රියාව වශයෙන් යෙදුණු විට ආඛ්‍යාතය තබනු ලබන්නේ අනුක්ත රූපයෙනි.

උදා:"... අපනැසූ තෙනැත්තන් රටින් දුරු කොටැ වඞ්කගිරිපර්වතයට යවනු මැනැවැ,...."(324)

ද්විත්ව උක්ත සහිත වාක්‍යවල කතුවරු දෙ දෙනා ම උක්ත රූපයෙන් යෙදේ.

උදා:"... දෙවතාවන් ගෙ විමන් රක්නොත් නුවණැත්තො මැ යැ."(157)

### වාක්‍යාර්ථ ප්‍රභේද

භාෂාවේ විවිධ වාක්‍යාර්ථ ප්‍රභේද දක්නට ලැබේ. පහත දැක්වෙන්නේ බුත්සරණෙහි අන්තර්ගත වාක්‍යාර්ථ ප්‍රභේද කිහිපයකි.

අස්ත්‍යර්ථ වාක්‍ය - "සියලු දෙවියො සාධුකාර දුන්හ."(353)

නිෂේධාර්ථ වාක්‍ය - "... ශක්‍ර දෙවෙන්ද්‍රයා පස්සෙහි හුණු දෙවතාවො මා සිතට නො වදිති..." (78)

ප්‍රශ්නාර්ථ වාක්‍ය - "අප ගෙ සර්වඥයන් වහන්සෙට අඹ ගසක් ලැබගැන්ම උගහට යැයි සිතූ ද?"(103)

"අනෙක් සිතක් සිතුවො කවුරු ද?"(106)

"... ආළවකය, කුමක්හි හසළ කලැ සුව එළවන්නෙ ද'යි කියා වේද තා විචාරන්නෙ?"(153)

නිෂේධ ප්‍රශ්නාර්ථ වාක්‍ය - "ඇපි සසරෙහි නොසිටිමො ද?"(186)

වාර්තාර්ථ වාක්‍ය - "එ වධ කරන පුරුෂයා මහනෙල් මල්පෙති සෙ අත්පා කපාහැරීල."(14)

යෝජනාර්ථ වාක්‍ය - "අද අප සතුරාණන් පිටු දකුම්හ..."(77)

විස්මයාර්ථ වාක්‍ය - "... බල එකෙක් මත් නා!"(123)

අවධාරණාර්ථ වාක්‍ය - "...ශ්‍රමණගෞතමයො ප්‍රාතිහාර්‍ය්‍ය කරන්නෙ අඹ ගසක් මුලදී යැ..."(101)

බුත්සරණින් අනාවරණය වන්නේ දොළොස්වන, දහතුන් වන සියවස්හි සිංහල භාෂාව මෙබඳු ස්වරූපයක් දැරූ බවයි. මෙ කල සිදු වූ භාෂා පරිණාමය ඉන් පසු අවධියේ දී (දහඅට වන සියවස දක්වා) සිදු වූ භාෂා පරිණාමයට සාපේක්ෂ ව වාක්‍ය විචාරය සම්බන්ධයෙන් විශේෂ වැදගත්කමක් දරයි (Wijemanne 1984:iii).

### සාකච්ඡාව

වර්තමාන නාම පදවල හා ක්‍රියා පදවල විද්‍යමාන වන බොහෝ ව්‍යාකරණ ලක්ෂණ හා ප්‍රභේද බුත්සරණෙහි අන්තර්ගත නාම පදවල හා ක්‍රියා පදවල දක්නට ලැබේ.

එ සේ ම බුත්සරණින් අනාවරණය වන්නේ මේ වන විට සිංහල භාෂාවේ නිපාත සියල්ල ම පාහේ තහවුරු වී තිබූ බවයි. එහෙත් දොළොස්වන, දහතුන්වන සියවස්වල භාවිතයේ පැවති ඇතැම් නිපාත හා නිපාතවල අර්ථ පසු කාලයේ දී අභාවයට ගොස් තිබේ. කෙ සේ වෙතත් බුත්සරණෙහි

අන්තර්ගත නිපාත තුළින් සිංහල නිපාත විකාශනයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් වී ඇත.

තව ද උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය පිළිබඳ ව වර්තමානයේ භාවිත වන බොහෝ ව්‍යාකරණ රීති මෙන් ම වාක්‍යාර්ථ ප්‍රභේද ද බුත්සරණෙහි දක්නට ලැබේ.

## නිගමනය

යථෝක්ත කරුණු අනුව පසක් වන්නේ බුත්සරණරචනා වූ සමය වන විට සිංහල භාෂාව වර්තමාන ව්‍යවහාරයට සමීප මට්ටමකට සංවර්ධනය වී පැවති බවයි. එ මෙන් ම වර්තමාන සිංහල භාෂාව හැඩගැස්වීමෙහිලා බුත්සරණෙහි අන්තර්ගත වාක්‍ය සංස්ථිතිය තුළින් නොමඳ පිටිවහලක් ලැබී ඇති බව ද මෙ මගින් පසක් වේ.

මේ අනුව පැහැදිලි වන්නේ බුත්සරණින් සිංහල භාෂාවේ වාක්‍ය සංස්ථිතිය පිළිබඳ විකාශනයේ සන්ධිස්ථානයක් සනිටුහන් වන බවයි.

## ප්‍රණාමය

මෙම පර්යේෂණය සඳහා මාර්ගෝපදේශකත්වය සැපයූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිංහල අධ්‍යයනාංශයේ මහාචාර්ය පියසීලි විජේමාන්න මහත්මියටත්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය දර්ශනී ගුණතිලක මහත්මියටත් මාගේ කෘතවේදීත්වය පළ කර සිටිමි.

## ආශ්‍රිත ග්‍රන්ථ හා ලේඛන නාමාවලිය


අභයසිංහ, ඒ.ඒ. (1992) *සිංහල භාෂාවේ සංකීර්ණ වාක්‍ය විභාගය*. කර්තෘ ප්‍රකාශනයකි.

අභයසිංහ, ඒ.ඒ. (1990) *සිංහල වාක්‍ය විභාගය - සරල වාක්‍ය*. කර්තෘ ප්‍රකාශනයකි.

කරුණාතිලක, ඩබ්. එස්. (2003) *සිංහල භාෂා ව්‍යාකරණය*, සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

කුමාරතුංග, මුනිදාස, අමරසිරි ගුණවඩු, (1965) *සිදත් සඟරා විවරණය*, කේ. ඒ. ආරියදස සහ සමාගම, කොළඹ.

කුලසූරිය, ආනන්ද, (1999) *සිංහල සාහිත්‍යය* 1, සී/ස(පෞද්.) විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.

දිසානායක, ජේ.බී., (2001) *ක්‍රියා පදය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

දිසානායක, ජේ.බී., (2000) *නාම පදය*. ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

පඤ්ඤාසාර හිමි, ඔක්කම්පිටියේ, (2004) *සිදත් සඟරා විමසුම*, කර්තෘ ප්‍රකාශනයකි.

පෙරේරා, තියඩෝර් ජී., (1985) *සිංහල භාෂාව*, : සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ලඞ්කානන්ද හිමි, ලබුගම, (1953)(සංස්.) *බුත්සරණ*, සී/ස ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

විජේමාන්න, පියසීලි, (2000) පැරණි සිංහලයේ අනාගත කාල ක්‍රියා පදයක් නැත, *වාග්විද්‍යා 7 සංස්.* කදුරුගමුවේ නාගිත හිමි, ඩී.එම්. වික්‍රමසිංහ, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

විජේමාන්න, පියසීලි, (2010) *12 වන ශතවර්ෂයෙහි සිංහල භාෂාවේ ස්වරූපය*, ආචාර්ය වැලමිටියාවේ ශ්‍රී කුසලධම්මනාහිමි අභිනන්දන ශාස්ත්‍රීය සංග්‍රහය, සංස්. මහින්ද සංඝරක්ඛිත හිමි සහ තවත් අය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, (1961) *සිංහල සාහිත්‍ය වංශය*, : ලේක්හවුස් මුද්‍රණාලය, කොළඹ.

Godakumbura, C.E., (1976) *Literature of Sri Lanka.:* Department of Archaeology, Colombo.

Gunasekara, Abraham Mendis, (1962) *A Comprehensive Grammer of the Sinhalese Language,* Sri Lanka Sahithya Mandalaya (Academy of Letters), Colombo.